# ‘පට්ඨාන’ ධර්ම දේශනා මාලාව
## ‘වීථි වාර - හේතු ප්‍රත්‍යය’
## 01.03. 2018

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සම්මා සම්බුදුපියාණන් වහන්සේට අර්ථය ධර්මය නිරුක්ති ප්‍රතිභානය කියන්නා වූ ඥාන ධර්මයන්ගෙන් පිරුණාවූ සන්තානයක් ඇති අතීතය අනාගතය වර්තමානය කියන කාලත්‍රයට සම්බන්ධ සියලුම ධර්මයන් ස්කන්ධ වශයෙන් ආයතනය ධාතු ඉන්ද්‍රිය වශයෙන් චතුරාර්ය සත්‍යය ධර්ම වශයෙන් පටිච්චසමුප්පාද හේතු ඵල ධර්ම වශයෙන් ගලපා දැක බලාගැනීමේ උතුම් ඥානයක් ඇත්තා වූ ශාන්තිනායක සම්මාසම්බුදු රජාණන්වහන්සේට චිත්ත චෛතසික රූප නිර්වාණ ප්‍රඥප්ති කියන්නා වූ සියුම් වූ ධර්ම ස්වභාවයන් විනිවිද දැක අවබෝධය කොට ගත්තා වූ උතුම් ඥාන සම්පත්තියක් ඇති ධර්මයෙන් පිරුණා වූ සන්තානයක් ඇති ඒ ධර්මයන් පෘථක්ජන සන්තාන වලට පෘථක්ජන භාවයෙන් මිදී යෑම පිණිස ආර්ය ධර්මයන් අවබෝධ කරගැනීම පිණිස සසර දුකෙන් මිදීම පිණිස විසිතුරුකොට උපමා උපමේය ගලපා දේශනා කරමින් ධර්මය පැහැදිලි කොට වදාළා වූ සත්වයන්ගේ සසර ගමන වැළැක්වුවාවූ වලක්වාලීමට කරුණාවෙන් පිහිට උනාවූ ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාරය කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ ශ්‍රී සත්ධර්ම රත්නයට ස්වාක්ඛාත ආදී ගුණයන්ගෙන් සමලංකෘත වූ සත්වයන්ගේ කෙළෙස් ගිනි නිවා ලන්නා වූ බුදු පසේබුදු මහරහතන්වහන්සේලා පහළ වීමට උපකාර වන්නා වූ ආර්යන්වහන්සේලාගේ සන්තානයේ පහළ වන්නා වූ ආර්ය තත්වයට පත්වෙන්න පිහිට වෙන්නා වූ ඒ උතුම් ධර්ම ස්කන්ධයට ධර්ම රත්නයට මම සිරසින් වැඳ නමස්කාරය කරනවා. මගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ ශාස්තෘ දේශනාවේ ගෞරවයෙන් පිහිටා නිහතමානීව පිහිටා උතුම් වූ ප්‍රණීත වූ ධර්මයට ලංව ධර්මය තමන්ගේ සන්තානයේ පිහිටුවාගෙන ධර්මය අවබෝධ කරගෙන බුදුරජාණන්වහන්සේගේ ශ්‍රාවක භාවයට පත් වී වදාළා වූ අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝරත්නයට මම සිරසින් වැඳ නමස්කාරය කරනවා. මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ අනන්ත වූ අපරිමාණ ගුණ බල පිහිටෙන් ධර්ම රත්නයේ අනන්ත අප්‍රමාණ ගුණ බල පිහිටෙන් සංඝරත්නයේ අනන්ත වූ අපරිමාණ ගුණ බල පිහිටෙන් ත්‍රිවිධරත්නයේ අනන්ත අප්‍රමාණ ගුණානුභාව බලයෙන්ද තුණුරුවන් පිළිබඳව එක මොහොතකට හෝ සිත පහදවාගෙන නමස්කාර කිරීමේ කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙන්ද මේ පින්වත් අසාගෙන සිටින්නා වූ සියලුම දෙනා මේ මොහොත දක්වාම සිත වශයෙන් කය වශයෙන් වචනය වශයෙන් තුන්දොර මෙහෙයවා සිදුකරගත්තා වූ

මහානුභාවසම්පන්න කුසල ධර්මයන්ගේ කුසල චේතනාවන්ගේ පුණ්‍ය චේතනාවන්ගේ ආනුභාව බලයෙන් අදත් බුදුරජාණන් වහන්සේගේ ඒ දේශිත ත්‍රිපිටක ධර්මයට අයිති දහම් කොටසක් වෙන අභිධර්ම පාඩම තුලින් කියලා දෙන්නා වූ කරුණු ටික අපේ පින්වත් මේ අසාගෙන ඉන්නා වූ සියලු දෙනාටම හොඳින් වැටහේවා! තේරුම් ගැනීමට ශක්තිය ලැබේවා! නිරවුල්ව අවබෝධ වේවා! පැහැදිලිව තේරුම් අරගෙන නිරවුල්ව තේරුම් අරගෙන ඒ ධර්මයට කොටුවෙන්නේ නැතුව ඒ ධර්මයට දෘෂ්ඨියෙන් ඇලීමක් බැඳීමක් තබා ගන්නේ නැතුව ධර්මය ධර්මය හැටියට දැක තමන්ගේ සන්තානයේ ඥානය උපදාවාගෙන ඉන්ද්‍රිය ධර්මයන් මෝරවාගෙන සැමදෙනාටම සසර දුකෙන් මිදී නිවනින්ම සැනසෙන්න ලැබේවා කියලා අපි මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. ඒ ප්‍රාර්ථනාවත් එක්ක අපි මේ පින්වතුන්ට විශේෂ පාඩමක් ඔස්සේ ධර්ම කොටස් ටිකක් කියලා දෙනවා.

අපි මීට පෙර කථා කළේ සූවිසි ධර්මයන් පිළිබඳවයි. සූවිසි ප්‍රත්‍යය ධර්මයන් ගැඹුරුයි. ඒවාගෙන් කථා කරන්නේ චිත්ත චෛතසික රූප ධර්ම පිළිබඳව. ඒවගේම සමහර අවස්ථාවල තැන් තැන් වලදී නිර්වාණය ප්‍රඥප්ති දෙකත් එකතුවෙනවා. මේ කථාව අපි ආරම්භ කළේ හේතු ප්‍රත්‍යය මුල් කරගෙන. හේතු ප්‍රත්‍යය ධර්ම මුල්කරගෙන කථා කිරීමේදී අපි මේ දහම් පාඩමට අනුව අවබෝධ කරගත්තා තේරුම් කරගත්තා සුතමය ඥානය වශයෙන් හේතු ධර්ම 6 ක් පිළිබඳව මේ මාතෘකාව යටතේ ඉදිරිපත් වෙනවා කියලා.

ඒ තමයි 'ලෝභ' 'ද්වේශ' 'මෝහ' - 'අලෝභ' 'අදෝස' 'අමෝහ' කියන මේ අකුසල හේතු තුනකුත් කුසල හේතු තුනකුත් ඒ හේතුවල තිබෙන්නා වූ ශක්තිය තමයි අපි නැවත වතාවක් මේ පාඩම තුලින් කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නේ. මේ දහම් පාඩම ආරම්භ කරන කාලයේදී දැනට අවුරුද්දකට දෙකකට කලින් අපි කථා කළා **හේතු ධර්ම** හයක් තිබෙනවා කියලා. හේතුව කියලා කියන්නේ බලවත් වූ ප්‍රධාන කාරණයක් වශයෙන් මුල් වෙච්ච මුල්බැහැ ගන්නා වූ කාරණයක් වශයෙන් ඉදිරි පත් වෙන්නා වූ හිතේ පහළ වෙන ධර්ම ශක්තීන් 6 ක්. මේ කියන කථාව අදට ගැලපෙන විදියට යොදා ගැනීමට අපි කියපු කොටසක් පිළිබඳව නැවත ස්මරණයක් කරලා බලමු මෙන්න මේ විදියට.

අපේ පින්වතුන් දන්නවා මේ පාඩමෙන් කෙරෙන්නේ මේ සාකච්ඡාවෙන් ඉදිරිපත් කරගන්නේ 'චිත්ත' 'චෛතසික' 'රූප' 'නිර්වාණ' 'ප්‍රඥපති' කියලා ධර්ම 5 තිබෙනවා, ප්‍රධාන වශයෙන් හතරයි. මේ චිත්ත චෛතසික රූප කියන ඒවා අපි කිව්වා හේතුවක ඵලයක් හැටියට පහළ වෙන්නා වූ ධර්ම කියලා. හේතු ඵල භාවයේ කැරකෙන ඒ භූමියේ පවතින ධර්ම කියලා. එතකොට සිතක් පහළ වෙනකොට ඒ සිත තනිවම හුදකලාව පහළ වෙන්නේ නෑ කියලා කිව්වා. හිතක් පහළ වෙනකොට හිතට බද්ධ වෙච්ච හිතට ගොනු වෙච්ච හිතේ වැඩිච්ච හිතට ආවේනික ගුණ ස්වභාව ටිකක් තිබෙනවා, චිත්ත ගති ස්වභාව ටිකක් තිබෙනවා. ඒවා චෛතසික ධර්ම හෙවත් චිත්ත ගති හැටියට අපි හැඳුන්වූවා. චෛතසික ධර්ම කියලා කියන්නේ හිතේ පහළ වෙන ධර්ම. මේ ධර්ම වලින් කරන වැඩක් තිබෙනවා. ඒ කියන්නේ මේ හිත කියන එක පහළ වෙන්නේ යම් කිසි අරමුණක් අරගෙනයි. අරමුණක්

නැතිව හිත පහළ වෙන්නේ නෑ. ඒ හිත අරමුණක් ගනිමින් පහළ වෙනකොට ඒ ඒ අරමුණේ හැටියට ඔය අද අපි කථා කරන හේතු ධර්ම වලින් එකක හෝ දෙකක හෝ තුනක ගොනු වීමක් හැදෙනවා. චිත්ත ගති ටිකක් හැදෙනවා. ඒවායේ උපකාරයෙන් තමයි හිතක් අරමුණට බැස ගන්නේ සහ අරමුණ අල්ලාගන්නේ. ඒ අරමුණ හසුකර ගැනීමේදී මේ හේතු කථාවෙන් කියවෙන 'ලෝභය' හෝ 'ද්වේශය' හෝ 'මෝහය' හෝ කුසල පැත්තෙන් නම් 'අලෝභය' හෝ 'අදෝසය' හෝ 'අමෝහය' ප්‍රධාන කටයුත්තක් සිද්ධ කරනවා අර අරමුණේ ගැලී හිටින්න, අරමුණට තදින් මුල් බැහැ ගන්න. ඔහොම ස්වභාවයක් තිබෙනවා මේ 'හේතු' වල. එතකොට හිතක් අරමුණ දැන ගැනීමේදී අරමුණක් සම්බන්ධයෙන් හිත පහළ වීමේදී මේ 'හේතු ධර්ම' ගිහිල්ලා ඒ අරමුණේ එක්කාසු වෙලා ඒකෙ තදින් ඇලී යන ගතියක් තදින් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන ගතියක් තිබෙනවා. ඒක නිසා අනිත් ධර්මත් එක්ක අනුයාත වෙන්න වෙලා තිබෙනවා. ඉතින් මේ කථාව තමයි අපි පහුගිය කාලයේ 'හේතු ප්‍රත්‍යය' යටතේ කළේ. ඉතින් අද මම කල්පනා කළා 'හේතු ප්‍රත්‍යය' කථා කළ නිසා ඒ 'හේතු ප්‍රත්‍යය' මාතෘකාව යටතේ තව ධර්ම විස්තරයක් කරන්න.

අපේ පින්වතුන්ට මතක ඇති සූවිසි පට්ඨානයට අනුකූල කථාව ඒ සාකච්ඡාව ආරම්භ වෙන්න කලියෙන් අපි උපකාරක ධර්ම සාකච්ඡා මාලාවක් සිද්ධ කළා. ඒ තමයි ධම්මසංගණී ප්‍රකරණයේ මාතෘකාවන් ටික සාකච්ඡා කළා. ඒක ආරම්භ උනේ **'කුසලා ධම්මා – අකුසලා ධම්මා – අබ්‍යාකතා ධම්මා' 'සුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා – දුක්ඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා – අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා'** යනාදී වශයෙන් ඒ ධර්ම ටික පිළිබඳව පිලිවෙලින් කථා කරගෙන ගියා. ඒ ටික කියලා ඉවරවෙලා සකච්ඡා කරලා දැනගෙන ඊට පස්සේ තමයි අපි පට්ඨානය පිළිබඳව සකච්ඡා කරන්න ඉගෙන ගන්න ආරම්භ කළේ. ඒ අපි කථා කරපු තික මාතිකාවේ තිබෙනවා **'කුසලා ධම්මා – අකුසලා ධම්මා – අබ්‍යාකතා ධම්මා'** කියලා ධර්ම සියල්ලක්ම වෙන්කොට කොටස් කරලා බෙදලා දක්වපු විදියක්. නමුත් මෙතැනදී පටලවා ගන්න හොඳ නෑ මේක සූත්‍ර ධර්මත් එක්ක ගලපලා. මේක සූත්‍ර විග්‍රහයක් නොවෙයි නමුත් සූත්‍ර ධර්ම වල තිබෙන්නා වූ ධර්මම තවත් සියුම් විදියට අර්ථ විග්‍රහ කරන්නා වූ ක්‍රමයක් තමයි මේ අභිධර්ම පාඩම් වලින් සිද්ධ කරන්නේ.

අපේ පිංවතුන් හොඳට මතක තබාගන්න මේ කථා කරනකොට කනට ඇහෙනවා **කුසලා ධම්මා** (කුසල ධර්මයෝ) - **අකුසලා ධම්මා** (අකුසල ධර්මයෝ) - **අබ්‍යාකතා ධම්මා** (අව්‍යාකෘත ධර්මයෝ) කියලා. මේකේ තුන්වෙනි පදය **'අව්‍යාකෘත ධර්ම'** කියලා තිබෙන්නේ. සූත්‍ර දේශනාවල් වල අව්‍යාකෘත ධර්ම කියලා සඳහන් කරන්නේ බුදුරජාණන්වහන්සේ උත්තර දීලා නැති ඒවාගේම බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කරලා නැති ලෝකය අනන්තද? ලෝකය අනන්ත නොවෙයිද? ආත්මය අනන්තයිද? අනන්ත නොවෙයිද? බුදුරජාණන්වහන්සේ ඉන්නවද? බුදුරජාණන්වහන්සේ නැත්ද? උන්වහන්සේ පරිනිර්වාණයෙන් පස්සේ ඉන්නවද? නැත්ද? කියන ඔයවගේ ලෝකයට සම්බන්ධ ආත්මයට සම්බන්ධ ප්‍රශ්න වලට බුදුරජාණන්වහන්සේ පිළිතුරු දීලා නෑ. බැරි නිසා නොවෙයි. බුදුරජාණන්වහන්සේගේ පිළිතුර ප්‍රශ්නයක් අහන්නා වූ කෙනාට තේරුම් ගන්න අවබෝධ කරගන්න හැකියාවක් නැති නිසා උන්වහන්සේ ඒ ප්‍රශ්න වලට පිළිතුරු

සපයලා නෑ. සූත්‍ර දේශනා වල්වල ඔය දහම් කොට්ඨාසය කථා කරන්නේ අව්‍යාකෘත ධම්ම කියලයි. මේ තමයි සූත්‍ර පිළිබඳව විස්තර කරනකොට අව්‍යාකෘත කියන වචනය පාවිච්චි කෙරෙන විදිය සහ එයින් හඳුන්වන ධර්ම කාණ්ඩය. අපි මේ කරන්නේ සූත්‍ර කථනයක් සාකච්ඡාවක් නොවෙයි. **'චිත්ත' 'චෛතසික ධර්ම' 'නිර්වාණය' 'ප්‍රඥප්තිය'** කියන සියුම් වූ ධර්ම මණ්ඩලයක් ධර්ම කොට්ඨාශ රාශියක් පිළිබඳවයි. එතැනටත් ඉදිරිපත් වෙනවා අව්‍යාකෘත කියන වචනය. පටලවා ගන්න එපා කියලා කිව්වේ අර සූත්‍ර දේශනා වලින් කියවෙන අව්‍යාකෘත ධර්මයි මෙතැනදී කියවෙන්නා වූ අව්‍යාකෘත ධර්ම කියන එකයි වචනය එක හඬ උනාට වචනය එක විදියට ලිව්වට කිව්වට මේ අවස්ථා දෙකේදී කියන්නේ දෙවිදියකට විස්තර වෙන කරුණු ටිකක්. ඒක නිසා මෙතැනට ගැලපෙන්නා වූ වචනයේ තේරුම් අපි දැන ගතයුතුයි.

**කුසලා ධම්මා** කියලා කියන්නේ හොඳ වශයෙන් ප්‍රණීත වශයෙන් ඉෂ්ඨ වශයෙන් හිතට මනාපයක් ඇතිකරන ආකාරයෙන් ක්‍රියාවක් සිද්ධ කරන්නත් ක්‍රියාවක් සිද්ධ කරනකොට ඇතිවෙන්නා වූ ඒ ධර්ම වලට කියනවා **කුසල ධර්ම** කියලා. තවත් විදියකට මේක අපි සලකා බැලුවොත් යම් කිසි හිතක **'අලෝභයත්' 'අද්වේශයත්' 'අමෝහයත්'** කියන චෛතසික ධර්ම එකක් හෝ දෙකක් හෝ තුනක් මුල් වෙලා යම් කිසි ක්‍රියාවක් සිද්ධ කරනවාද සිතුවිල්ලක් සිතනවාද වචනයක් කථා කරනවද ඒ ටික කුසල මූල ධර්ම එක්කාසු වෙලා කෙරෙන නිසා ඒකට කියනවා **කුසලා ධම්මා** කියලා. **අකුසලා ධම්මා** කියලා කියන්නේ **අකුසල චෛතසික 'හේතු ධර්ම'** මුල් වෙලා ඒවායේ සහ සම්බන්ධ තාවය මිශ්‍රණය එක්කාසු වීම ඇතුව යම් කිසි සිතුවිලි පරපුරක් සිත් රාශියක් අරමුණු ගැනීමක් සිතින් කයින් වචනයෙන් ක්‍රියාත්මක වීමක් වෙනවද ඒ අවස්ථාවේදී පහළ වෙන චිත්ත චෛතසික ධර්මයන්ට කියනවා අකුසල ධර්ම කියලා.

කුසල ධර්මත් නොවෙන අකුසල ධර්මත් නොවෙන දේවල් තිබෙනවා. කුසලයක් කියලා කියන්නේ අනාගතයේදී හොඳ ශක්තියක් හොඳ විපාකයක් ප්‍රණීත විපාකයක් ගොඩ නගන්න ඇති කරන්න මතුකරන්න පුළුවන් ශක්තියක් තිබෙන මනෝමය ධර්ම විශේෂයක්, ගුණ විශේෂයක්, සිතුවිලි රාශියක්, චෛතසික රාශියක්. අකුසල ධර්ම කියලා කියන්නේ අනාගතයේදී ප්‍රතිපලයක් හැටියට විපාකයක් හැටියට ........මෙතැන සිට කෙටි දුරක් පටිගත වී නැත.

මේ ටික කෙටියෙන් හිතේ දරා ගන්න ඕන. දරා ගැනීම වටිනවා. හේතුව ඉස්සරහට කියවෙන දහම් පද ටික තේරුම් ගැනීමට මේක උපකාර වෙනවා.

ඊළඟට මේ **හේතු ප්‍රත්‍යය** යටතේ කථා කරනකොට කිව්වා **'හේතු ධර්ම'**. එකක් තමයි **'ප්‍රත්‍යය ධර්ම'** කිව්වා **'ප්‍රත්‍යය නිසා හටගන්නා ධර්ම'** කිව්වා. **ප්‍රත්‍යය** කියලා කියන්නේ යම්කිසි ධර්මයක් හටගැනීමට බලයක් හැටියට - මූලයක් හැටියට - ප්‍රත්‍යයක් හැටියට ඉදිරිපත් වෙන ඒවාට කියනවා **ප්‍රත්‍යය ධර්ම** නොහොත් උපකාරක ධර්ම කියලා. ඒකෙන් ඇති වෙන්නා වූ මතු වෙන්නා වූ ධර්මයට කියනවා ප්‍රත්‍යය උප්පන්න ධර්මය කියලා. මේ කථාව කරනකොට **හේතු ප්‍රත්‍යය** මාතෘකාවේ අපිට කථා කරන්න වෙනවා පේළි වශයෙන් හතක් **'කුසල' 'අකුසල'** සහ **'අව්‍යාකෘතයට'** දාල. **හේතු ප්‍රත්‍යය** ධර්ම තුන්

ගොඩකින් කථා කරනවා. අපි ඉස්සෙල්ලා කිව්වා **'කුසලා ධම්මා' 'අකුසලා ධම්මා' 'අබ්‍යාකතා ධම්මා'** කියලා **හේතු ප්‍රත්‍යය** ධර්ම තුන් ගොඩකින් කථා කරනවා. අපි මෙන්න මේ විදියට මේ කාරණය තේරුම් ගනිමු.

මේ හේතු ප්‍රත්‍යයයේ තිබෙනවා කථා කරන්න වීථි හතක්. ඒකට කියනවා විසර්ජනා කරන්නා වූ විමසා බලන්නා වූ පේළි වලට දාල වීථි වලට දාල සකච්ඡා කරන කොටස කියලා. එතකොට මතක තබා ගන්න **හේතු ප්‍රත්‍යය** මාතෘකාව යටතේ වීථි හතක් කියවෙනවා. ඒ පේළි මොනවාද කියලා අපි මේ විදියට බලමු.

පොතක් පතක් තිබෙනවා නම් ලියාගත්තත් කමක් නෑ. හැබැයි මම බුදුරජාණන්වහන්සේගේ නිර්මල ශ්‍රී මුඛයෙන් දේශනා කොට වදාළා වූ ඒ මිහිරි වූ මදුර වූ පාලි භාෂාව පාවිච්චි කරනවා. ඒ පාලි භාෂාවේ තේරුම අපි දැනට කථා කරන සිංහල භාෂාවෙන් අද මේ කියන්නා වගේ කියලා දෙනවා. මේකෙදි පාලි භාෂාවේ වචනයි සිංහල භාෂාවේ වචනයි සමහර තැන් වල සමාන වෙනවා. සමහර තැන් වල අසමාන වෙනවා. ඒක පටලවා ගන්න හොඳ නෑ.

මම මේවගේ පාලි වාක්‍යක් කියනවා.

1) **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො -** මේ පාලි වාක්‍යයේ තිබෙනවා පාලි වචන 7 ක්. මේ බුදුරජාණන්වහන්සේ ධර්මය දේශනා කරන්න පාවිච්චි කරපු විසිතුරු වූ ඒවගේම පිරිසිදු වූ පැහැපත් වූ උන්වහන්සේගේ බුදු නුවණින් යහපත් කියලා ඒ උතුම් ධර්මය දේශනා කරන්න තෝරාගත්ත භෂාවේ වචන ටිකක්. මේකේ සිංහල තේරුම මේ විදියට කියනවා.

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** = කුසල ධර්මය කුසල ධර්මයකට මූල භාවයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එක. මේවා එක ළඟ යන වචන නිසා මේකේ අවබෝධ ටිකක් ගැටෙන්න පුළුවන් කෙනෙකුගේ හිතට. අනාගතයේදී හොඳ විපාකයක් - හොඳ ශක්තියක් - විඳින කොට සැප ශක්තියක් - ඒවගේම වැරදි නැති ප්‍රණීත ශක්තියක් - ප්‍රණීත ගුණයක් මතුකරලා දෙන්න පුළුවන් ගතියක් තිබෙන බලයක් තිබෙනවා. මෙතැන කුසල ධර්මය කියලා කිව්වේ ඒකට. ඒ බලයට කියනවා **කුසලෝ ධම්මෝ** කියලා. නමුත් ඒක ජීවයක්වත් සත්වයෙක්වත් පුද්ගලයෙක්වත් දෙවියෙක්වත් මනුස්සයෙක්වත් නොවෙයි. ඒක අනාගතයේදී කොතැනක දී හෝ වේවා රූපයක් එක්කාසු කරගෙන ආශ්‍රය කරගෙන හෝ නොගෙන හෝ මොකක් හරි විපාක වශයෙන් හොඳක් මතු කරන්න පුළුවන් හොඳක් උපදවන්න පුලුවන් ශක්තියක් තිබෙන එකට කියනවා කුසල ධර්මය කියලා. ඒවගේ කුසල ධර්මයක් ශක්තියක් බලයක් අනාගතයේදී විපාකයක් හැටියට මතුවෙන්නා වූ අනාගතයේදී විපාක දෙන ගතියක් ඇති, එතැනදීත් සත්වයෙක් පුද්ගලයෙක් නොවෙන්නා වූ ධර්ම ස්වාභාවයකට ගුණ ස්වභාවයකට 'හේතු භාවයත්' මුල් වෙලා යම්කිසි ප්‍රත්‍යය වීමක් - උපකාරයක් වශයෙන් ඉදිරපත් වීමක් තිබෙනවා. ඒ කථාව තමයි මේකෙදි කියන්නේ. හොඳ ශක්තියකින් හොඳ ශක්තියකට උපකාර වෙනවා. හොඳ බලයක් තව හොඳ බලයකට උපකාර වෙනවා. හොඳ

ගුණ ස්වභාවයක් තවත් හොඳ ගුණ ස්වභාවයකට උපකාර වෙනවා - ප්‍රධාන වෙලා මුල් වෙලා උපකාර වෙනවා. දැන් බලන්න, හොඳක් හොඳකට උපකාර වෙනවා කියන එකයි කරන්නේ. දැන් මේ වේලාවේදී හිතක් පහළ වෙනවා කියලා කියන්නේ සත්වයෙක් නොවෙයි ජීවයක් නොවෙයි පුද්ගලයෙක් දෙවියෙක් ආත්මයක් නොවෙයි. ඒක හොඳයි කියලා සලකන්න පුළුවන් ගුණ ශක්තියක්. ඒකෙ බලයෙන් යම්කිසි තැනක හෙට හෝ අනිද්දා ලබන සතියේ ලබන මාසයේ ලබන අවුරුද්දේ ලබන ආත්මයේ කොතැන හෝ තැනක හොඳට ප්‍රණීත ආකාරයෙන් යම්කිසි දෙයක් මේකේ බලයෙන් ඉලිප්පෙනවා නම් මතුවෙනවා නම් උපදිනවා නම් ඒකට උපකාර වෙන්නේ මෙතැන පහළ වෙච්ච හොඳ කුසල බලයයි. මේ හොඳ කුසල ශක්තිය තමයි අතන පහළ වෙන කුසල ශක්තියට ප්‍රත්‍යය උනේ. ඔය කථාව තමයි මේ ලස්සනට පැහැදිලිව පිරිසිදුව කියන්නේ **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියලා.

බුදුරජාණන්වහන්සේ මෙතැනදී සත්ව කථා - පුද්ගල කථා අයින් කරලා තිබෙන්නේ. ජීව කථා ලෝක ඔක්කොම අයින් කරලා යම් කිසි බලයක් ගුණයක් ක්‍රියාත්මක වෙනවා තවත් ගුණයකට උපකාර වශයෙන් කියන කථාවක් මේ කියන්නේ. මේක ආත්ම හැඟීම අයින් කරන්න ඉවත් කරන්න අතු ගා දාන්න මහා උපකාරක දේශනාවක්. දැන් අපි කථා කරන මාතෘකාව කළේ හේතු ප්‍රත්‍යය යටතේ කියවෙන්නා වූ දහම් පද 7 ක්. මේ කිච්චේ පළවෙනි එක.

ඊළගට ඒක විස්තර කරනවා මෙහෙම.

- **කුසලා හෙතූ සම්පයුත්තකානං ඛන්ධානං හෙතුපච්චයෙන** පච්චයො.

මෙතැනත් තිබෙනවා වචන හතක්. **කුසලා හෙතූ** = හොඳ භාවයේ තිබෙන්නා වූ **'හේතු'** ධර්මයෝ. හොඳට මතක තබා ගන්න **'කුසල හේතු'** කියලා කියන්නේ **'අලෝභය' 'අදෝසය' 'අමෝහය'**. ඇයි මේවාට කුසලා හේතු කියලා කියන්නේ? මේවායේ තිබෙනවා හොඳක් කරනකොට මේ ධර්ම තුන ඉස්සරහට ගිහිල්ලා හොඳක් කිරීමේදී අරමුණේ හොඳට ශාන්තව බලවත් ලෙස පැලපදියන් වෙලා බලවත් ලෙස ඒකට අහුවෙලා බලවත් ලෙස අරමුණෙහි තදින් ඇලිලා අනිත් ධර්ම වලට උපකාර වෙනවා. ඕක තමයි **කුසල හේතු ධර්මවල** තිබෙන ස්වභාවය. මේ **කුසල හේතු** කියලා කියන්නේ **'අලෝභය' 'අදෝසය' 'අමෝහය'** කියන ඔය තුන්දෙනා. ඔය ධර්මතා තුන **'සම්පයුත්තකානං ඛන්ධානං'**. ඒ කියන්නේ **'අලෝභය' 'අදෝසය' 'අමෝහය'** කියන තුන්දෙනත් එක්ක ඉන්නා වූ අනිත් ස්කන්ධ වශයෙන් කථා කරන්න පුළුවන් චෛතසික ධර්ම. **සම්පයුත්තක ඛන්ධ** කියලා කියන්නේ **'වේදනාව' 'සංඥාව' 'සංඛාර' 'විඤ්ඤාණ'**. විශේෂයෙන්ම මනෝමය වශයෙන් ඇතිවෙන්නා වූ මේ ධර්ම ටික **සම්පයුත්තක ඛන්ධ** වෙනවා. ඒ **සම්ප්‍රයුක්තක ස්කන්ධ** වලට **හේතු පච්චයෙන පච්චයෝ** = මූලික ස්වභාවයෙන් ප්‍රත්‍යය වෙනවා. මේකේ තවත් එකක් තිබෙනවා පරෙස්සම් වෙන්න. **සම්ප්‍රයුත්තක ඛන්ධ** කියලා කිච්චහම අපි තේරුම් ගන්න ඕනෑ චිත්ත චෛතසික කථාව කරන්නේ නැතුව හරි ලේසියෙන් පාවිච්චි කරපු වචනයක් එක්කාසු කරගන්නවා **ඛන්ධ** කියලා. එහෙනම් තේරුම් ගන්න ඕනෑ වෙන්නේ **'වේදනා චෛතසිකයි' 'සංඥා චෛතසිකයි'** අනිත් **'කුසල චෛතසික'** ටිකයි, ඊට පස්සේ **'හිතයි'**

**සම්ප්‍රයුක්තව බන්ධ** නම්වෙනවා . එහම නම් කුසල හේතු කියලා කිව්වේ **'අලෝභ' 'අදෝස' 'අමෝහ'** යන තුන්දෙනා අනිත් ධර්ම වලට එනම් **බන්ධ** වශයෙන් සලකන **සම්ප්‍රයුක්ත ධර්ම** වලට මූල භාවයෙන් **'හේතු වීම්'** වශයෙන් ප්‍රත්‍යය වෙනවා. හේතුව, ඒ තුන් දෙනාට (අලෝභ අදෝස අමෝහ) එහෙම කරන්න පුළුවන් හැකියාවක් බල ස්වභාවයක් තිබෙන නිසා.

මෙතැනදී මේ තුන්දෙනාට තිබෙනවා බල ශක්තියක්. ඒ කියන්නේ ප්‍රත්‍යය ශක්තිය එනම් අනිත් අයට උපකාර වීමේ හැකියා ගුණය තිබෙනවා. අපි තව එකක් ගනිමු මෙහෙම. පිනක් කරන වෙලාවේදී කුසල වශයෙන් කථා කරන ඔය සිත් ඔක්කෝම ටික එතැනට කඩාගෙන එන්නේ නෑ. අපි කියනවා කුසල් සිත් කියලා ජාතියක්. ඒ තමයි කාමාවචර කුසල් සිත් 8 + රූපාවචර කුසල් සිත් 5 ක් + අරූපාවචර ධ්‍යාන ගැන කථා කිරීමේදී එතැන තිබෙනවා සිත් 4 ක් සහ ලෝකෝත්තර සිත් 4 ක් තිබෙනවා. ඔය විදියට කුසල ධර්ම හැටියට කථා කරන සිත් ටිකක් තිබෙනවා. ඒ සිත් ඔක්කොම එක පොදියට එක තැනකට අහුවෙන්නේ නෑ. ඔය සිත් ටිකෙන් එකක් විතරයි ඉදිරිපත් වෙන්නේ. ඒ එකක් ඉදිරිපත් වෙනකොට ඒ එක හිතක තිබෙනවා ඔය විදියට වැඩ කරන්නා වූ හිතකුත් ඒවාගේම චෛතසික ධර්ම රාශියකුත්. සාමූහික වශයෙන් ගත්තට පස්සේ කුසල් චෛතසික තිබෙන්නේ 38 යි. නමුත් එක සිතක පහළ වෙනකොට 32 ක් 33 ක් 34 ක් විදියට තමයි වැඩ කරන්නේ. එක හිතක පහළ වෙන්නා වූ කුසල මූලයෝ ටික අනිත් චෛතසික ධර්ම වලට සහ හිතට යම් කිසි බලපෑමක් කරනවා ප්‍රත්‍යය වෙනවා කියන කතාවයි තිබෙන්නේ. එතකොට ප්‍රත්‍යය ශක්තියක් තිබෙනවා නම් උපකාර වීමේ ගුණයක් ඒ ධර්මතා තුනට තිබෙනවා නම් ඒ උපකාරය ඒ පිහිට ඒ ආධාරය ලබන්නේ මොනවාද? ඒ තමයි හිත. හිත ඒ මූල ධර්මයන්ගේ උපකාරය ලබනවා. වේදනාව ඒ මූල ධර්මයන්ගේ උපකාරය ලබනවා. සංඥා චෛතසික ඒ හේතු ධර්මයන්ගේ උපකාරය ලබනවා. ඊළඟට අනිත් චෛතසික ධර්මත් ඒවගේ උපකාරය ලබනවා. එතකොට උපකාර ලබන්නා වූ ඒවාට තමයි කියන්නේ ප්‍රත්‍යය උප්පන්න ධර්ම - ප්‍රත්‍යය ලබන ධර්ම - උපකාරය ලබන්නා වූ ධර්ම කියලා.

උදාහරණයක් හැටියට මෙහෙම ගත්තොත් අපි දානමය පින්කම් සිද්ධ කරනවා. දානය පූජා කරනවා. නිත්‍ය සමාදන් වීම වශයෙන් පෝයට අට සිල් දස සිල් ආරක්ෂා කිරීමත් සිද්ධ කරනවා. ඒවගේම කර්මස්ථාන ඉදිරිපත් කරන භාවනා කිරීම් වශයෙනුත් පිං කරනවා. දැන් බලන්න දානය දෙනවා සිල් සමාදන් වෙනවා. භාවනා කටයුතු කරනවා. උදේ හවා වන්දනා කරනවා පහන් පත්තු කරනවා. ඊළඟට මල් පූජා කරනවා. බණ අහනවා. ඊළඟට සේනාසන අතුපතු ගෑම් වශයෙන් බෝධිමලු අතුපතු ගෑම් වශයෙන් වතාවත් කරනවා. ස්වාමීන් වහන්සේලාට ඇප උපස්ථාන කරනවා. පිං අනුමෝදන් කරනවා. මිය පරලොව ගිය අයට පිං දෙනවා. ධර්ම සාකච්ඡා කරනවා. මේවා ඔක්කොම හොඳ ක්‍රියා හැටියට සලකනවා. ඒක සිද්ධ වෙන්නේ බණ අහනකොට කනින්, වන්දනා කරනකොට වචනයෙනුයි කයෙනුයි. භාවනා කරනකොට හිතෙන්. සිල් රකින කොට කයෙන් වචනයෙන්. දානය දෙනකොට කයෙනුයි සිතෙනුයි, වචනයත් ඒ වෙලාවට සම්බන්ධ වෙනවා. ධර්ම සකච්ඡා කරනකොට හිතයි වචනයයි. පිං අනුමෝදන් කරනකොට වචනයයි සමහර විටෙක් පැන් වඩනකොට කය මේ ක්‍රියාවල් සිද්ධ කරනවා. ඒවායින් සමහර කොටස් පිටට පේනවා. මේ කයෙන් කරන ක්‍රියාවේදී හොඳයි කියලා කරන

දේවල් වචනයෙන් කරන දේවල් හිතින් කරන දේවල් තුල අපිට නොපෙනෙන්නා වූ අපිට පිටට නොදැනෙන්නා වූ ධර්ම ගුණයක් තිබෙනවා හිතේ. ඒවා මෙහෙයවනවා. ඒක කාමාවචර මොකක් හරි කුසල හිතක්. ඒ කුසල හිතේ අර ක්‍රියාවල් කරවන දුවවන බණ අස්සවන බණ සඳහා කථා කරවන - යවන - වන්දනා කරවන - බලවත් කම තිබෙන සිත් පහළ වෙනවා. ඒ සිත් ජවන් සිත්. ඒ ජවන් සිත් වලින් කෙරෙන්නා වූ මෙහෙය තමයි පිටට ඉදිරිපත් වෙන්නේ. වන්දනා කරනකොට කාමාවචර කුසල සිතක් පහළ වෙනවා. ගාථා කියනකොට කාමාවචර කුසල් සිත් පහළ වෙනවා. පින් දෙනකොට කාමාවචර කුසල් සිත් පහළ වෙනවා. මේවා කාමාවචර සිත්.

මෛත්‍රී කර්මස්ථානය අරගෙන භාවනා කරනකොට රූපාවචර ධ්‍යාන සිත් උපදවා ගත්තොත් ඒ විදියයි. ඔය විදියට රූපාවචර වශයෙනුත් අරූපාවචර වශයෙනුත් කුසල් පහළ වෙනවා. දැන් බලන්න මේකේ වැඩක් කරනකොට පහළ වෙනවානේ සිතක්. ඒ සිත අස්සේ තමයි අපි කියපු **'අලෝභය' 'අදෝසය' 'අමෝහය'** කියන්නා වූ දේවල් වැඩ කරවන්නේ. කයින් ක්‍රියාවක් කරවන කයින් වන්දනාව කරවන වචනයෙන් ගාථා කියවන ඔක්කොම කෙරෙන්නේ ඒවා කියවන්න හැකියාව තිබෙන ජවන් සිත් පහළ වීම හරහා. ඔය ජවන් සිත් ඔය වචන කථා කරවන්නේ කුසල් වශයෙන් ක්‍රියා කරවන්නේ ඒ සිත්වල තිබෙනවා කයින් වචනයෙන් සිතින් ඒවා කරවන්න පුළුවන් කුසල ගතිය. ඔන්න ඔතැනදී තමයි අර **'අලෝභ හේතු' 'අදෝස හේතු' 'අමෝහ හේතු'** කියන දේවල් දෙකක් හෝ තුනක් ඒ අවස්ථාවේ හැටියට ඒ ක්‍රියාවේ හැටියට පහළ වෙන්නේ. ඒ පහළ වෙනකොට ඒ චෛතසික ධර්මයෝ **හේතු භාවයෙන්** මූල භාවයෙන් අනිත් අර ක්‍රියා කරවන ජවන් සිතටත් චෛතසික ධර්මයන්ටත් යම් කිසි බලගැන්වීමක් - උපකාර වීමක් - බලපෑම් කිරීමක් - හසුරුවා ගැනීමක් සිද්ධ කරනවා. ඒක තමයි **හේතු ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය** වෙනවා කියලා කියන්නේ **කුසල ධර්මයක් කුසල ධර්මයකට**.

දැන් මම මේ කෙටියෙන් මේ පින්වතුන්ට කිව්වේ කුසල ධර්මයක් කුසල ධර්මයකට හේතු ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එකයි. තවත් පොඩි උදාහරණයක් ගමු. අපි මෛත්‍රී කර්මස්ථානයක් අරගෙන ඒ කියන්නේ සත්ව අරමුණක් ඉදිරිපත් කරගෙන අපි නිරන්තරයෙන්ම සුවපත් වේවා! සුවපත් වේවා! කියලා අවංක සිතින් වඩනවා. මෙහෙම කරගෙන යනකොට ජවන් සිත් අවශ්‍යයයි. ඒ කියන්නේ මෛත්‍රී වඩන්න ජවන් සිත් අවශ්‍යයයි. ඒ ජවන් සිත් අස්සේ තිබෙනවා **'අලෝභ හේතුව' 'අදෝස හේතුව' 'අමෝහ හේතුව'**. මේ තුන් දෙනා අර අනිත් චෛතසික ධර්මයන්ටත් හිතටත් හරි බල ඇණියක් වෙනවා. එතකොට ඒ මෛත්‍රී ආරම්මණයට අර සත්ව සංඥාවට හොඳට තදින් කා වැදිලා කිඳා බැහැලා ඒකෙ බැසගෙන ඉන්න ගතියක් මේ තුන් දෙනාට කරන්න පුළුවන්. සිතටත් ඒකෙ ඉන්න පුළුවන්කම තිබෙන්නේ මේ තුන්දෙනාගේ බලය නිසා. ඔන්න ඔය විදියට තමයි මේ පදය තේරුම් ගන්න ඕනෑ. කුසල ධර්මයක් තවත් කුසල ධර්ම කියන චෛතසික ධර්මයන්ට හේතු වෙනවා උපකාර වෙනවා කියන එකයි ඒ වෙලාවේදී සිද්ධ වෙන්නේ. මම මුලින් විස්තර කරනකොට කිව්වා මෙතනින් යම්කිසි බලයක් හැදුවොත් එහෙම අනාගතයේදී යම්කිසි දෙයකට පිහිට වෙනවා කියලා. ඕක කිව්වේ දුර තියලා තේරුම් ගන්න. අපි ඉස්සරහදි ඕක කථා කරනවා. ඒක අව්‍යාකෘත යටතේ කථා කරන්නේ. මේ කියන්නේ ඒ වෙලාවේදී ඒ මොහොතේදී කුසලයක් ස්කන්ධයන්ට **හේතු ප්‍රත්‍යය** වෙන තාලේ.

දැන් එක පේළියක් කිව්වා. මේක කියනවානම් කාමාවචර කුසල් සිත් අටට අට වතාවක් කියන්න ඕනෑ මේක වෙන්නේ කොහොමද කියලා. කාමාවචර කුසල් සිත් 8 ජවන් සිත් වල අට වතාවකට **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියලා විස්තර කරන කොට තමයි හොඳට මේක අහුවෙන්නේ. ධ්‍යාන සිත් 5 දැන ගත්තහම ඒකෙත් 5 වතාවක් යන්න ඕනෑ. **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියලා ඒ ඒ හිතට සහ අනිත් චෛතසිකයන්ට කොහොමද උදව් වෙන්නේ උපකාර වෙන්නේ කියලා.

ඊළඟට අරූපාවචර ධ්‍යාන උපදවන කොටත් ඒ හිතට ගැලපෙන හැටියට මේක තේරුම් ගන්න ඕනෑ. ලෝකෝත්තර මාර්ග සිත් 4 ඒ විදියයි. හරියට කියනවා නම් 20 වතාවක් දිගටම කියාගෙන යන්න ඕනෑ මේ හැම සිතකදීම **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියලා කියන්නේ මේකයි කියලා. එතකොට තමයි හිතට කා වදින්නේ. නමුත් මේ පින්වතුන් මේ විදියට තේරුම් ගන්න විස්තරාත්මකව මෙනෙහි කරන්න. එක හිතක් කියලා කියන්නේ චෛතසික රාශියක් එක්ක පහළ වෙන සිතක්. ඒ කියන්නේ නාම ධර්ම සමූහයක්. එතැන තිබෙන නාම ධර්ම සමූහයෙන් විශේෂ නාම ධර්ම තුනක් අනිත් ඒවාට යම්කිසි හයිය ගැම්ම පවත්වන බලපෑමක් කරන මූල භාවයෙන් ප්‍රත්‍යයවන එකක් තමයි ඔතැන තිබෙන්නේ. ඒ ටික තමයි කිව්වේ. පළවෙනි පේළිය මේ විදියට කෙටියෙන් අවසන් කළා.

2) **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** = කුසල ධර්මය අව්‍යාකෘත වූ ධර්මයකට හේතු ප්‍රත්‍යය භාවයෙන් යම්කිසි බලපෑමක් පිහිට වීමක් උදව් වීමක් කරනවා.

මම මතක් කළා මේ පින්වතුන්ට මේ අබ්‍යාකත කියන ධර්මය පටලවාගන්න එපා කියලා. සූත්‍ර නොවෙයි මේ කථා කරන්නේ. මේ කථා කරන්නේ **නාම ධර්ම** සහ **රූප ධර්ම**. ඒ කියන්නේ චිත්ත චෛතසික ධර්ම. මෙතැන කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයකට හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම මේ විදියටයි අපි තේරුම් ගන්න ඕනෑ. අපි කිව්වා කුසල් සිත් 21 තිබෙනවා කියලා. එතකොට ඒ කුසල් සිත් වල ප්‍රඥාව ක්‍රියාත්මක වෙන්නේ නැති තැන් තිබෙනවා. සමහර සිත් තිබෙනවා 'අලෝභ හේතුවයි' 'අදෝස හේතුවයි' 'අමෝහ හේතුවයි' කියන 'හේතු ධර්ම' තුනම තිබෙන. එතකොට ඒවා ඒ අවස්ථා දෙකේදීම දෙකක් තුබුණා හෝ චේවා තුනක් තිබුණා හෝ චේවා ඔය වෙලාවේදී බලන්න අපේ හිතේ කුසල් සිතක් පහළ වෙනකොට ඒ කුසල් සිතට සමානානුපාතිකව ඒ කුසල් සිතේ ආනුභාවයත් එක්ක අපේ ශරීරයේ තිබෙන්නා වූ රූප වල යම්කිසි වෙනස් කමක් ඇතිවෙනවා. ඒකට කියනවා **චිත්තජ රූප** වල පහළ වීම කියලා. අපි කිව්වා 'කර්මජ රූප' 'චිත්තජ රූප' 'සෘතුජ රූප' 'ආහාරජ රූප' කියලා රූප වර්ග 4 ක් පහළ වෙනවා කියලා. මෙතැන මේ කියන්නේ ඔය හතරම නොවෙයි. ඔය හතරෙන් එකක්.

අපි බුදුරජාණන්වහන්සේගේ පිළිමවහන්සේ දිහා ලස්සනට ඉතාම ශාන්ත සුන්දර ඒවාගේම තමන් ළඟට ගියහම තමන්ට කථා කරනවා තමන් දෙස කරුණාවෙන් නෙත් යොමා

බලාගෙන ඉන්නවා වගේ හැඟීමක් ඇතිකරන ලස්සන පිළිතුරු බුදු පිළිමයක් ඉදිරියට ගිහිල්ලා අත්දෙක එකතු කරගෙන ඒ දිහා බලාගෙන වැඳගෙන බුදුරජාණන්වහන්සේගේ කරුණාගුණය අවිහිංසාවට කොතරම් උතුම් තැනක් දුන්නාද කියන කාරණය, උන්වහන්සේට මිනුස්සු බැණ්නත් ගණන් නොගෙන ඉන්නවා කියන කාරණය, මොන ප්‍රයෝජනයක් පතාගෙනද සත්වයන්ට මේ උදව් කරන්නේ උපකාර කරන්නේ කියන කාරණය, බුදුරජාණන් වහන්සේ කිසිම දෙයක්වත් එක බත් හැන්දක් එකම වන්දනාවක්වත් හොඳයි කියලා කියව ගන්නවත් කිසිම දෙයක්වත් ප්‍රාර්ථනා කරන්නේ නැතුව කිසිම තැනක ප්‍රසිද්ධියක් නම්බුනාමයක් අපේක්ෂා කරන්නේ නැතුව මේ ලෝකයාට පිහිට වෙනවා කියන ඒ කරුණා ගුණය ඒ අව්‍යාජ බුදුගුණය පිළිබඳව ඒ රූපය දිහා බලාගෙන මෙනෙහි කරනකොට අපේ හිතේ පහළ වෙන්නේ අර ඉස්සෙල්ලා කියපු **'අලෝභ හේතුවයි' 'අද්වේශ හේතුවයි' 'අමෝහ හේතුවයි'** සමග ඒකෙ බලපෑමෙන් පහළ වෙන්නා වූ තවත් **චිත්ත චෛතසික ධර්ම** ටිකක්.

මේ විතරක් නොවෙයි. මෙතැන කියන්නේ ඒ එක්කම අපේ හිතේ ඇතිවෙනවා පුදුම විදියේ සැහැල්ලු ගතියක් බරනැති ගතියක් සෞම්‍ය ගතියක් උඩ පාවෙනවා වගේ ගතියක් ඇස් දෙකට කඳුළු පිරිච්ච ගතියක් ඒවාගේම පුදුම ප්‍රසාදණීය, ජීවිතය උනත් මට පුදන්න පුළුවන් කියන හැඟීමක් එක්ක ශරීරයේ රූප වල ඇතිවෙනවා අමුතු විදියේ ගුණ ස්වභාවයක්. ඒ රූප වලට කියනවා 'ඒ කුසල් සිතෙන් උපන් රූප' කියලා. බුදුරජාණන්වහන්සේ දෙස බලාගෙන ඉන්නකොට ඒ කුසල් සිතෙන් පහළ වෙන රූප වලට කියනවා චිත්තජ රූප කියලා. ඒ සිතින් උපන් රූප **කුසල** හැටියට කථා කරන්නේ **නෑ. ඒ රූප** කථා කරන්නේ **අව්‍යාකෘත ධර්ම** හැටියටයි. චෛතසික ධර්ම නම් **කුසලා ධම්මා** කියලා කථා කරනවා. නමුත් මේ **'රූප'** හිතක පහළ වෙන ඒවා නොවෙයි. ඒවා හිත නිසා ඇඟේ පහළ වෙන ඒවා. රූප සලකන්නේ අව්‍යාකෘත ධර්ම හැටියට, මේ කථාවේදී. ඒක නිසා මේ කුසල් සිතේ සම්ප්‍රයුක්ත ධර්මත් එක්ක මේ කුසල් සිත පහළ වෙනකොට ඒ සිතට සමාන්තරව පහළ වෙන ඒ රූප වලට ඒ හිතේ බලපෑමක් ඒවාගේම හේතු ධර්මයන්ගේ බලපෑමක් ඒ කුසල ධර්මයන්ගේ බලපෑමක් සිද්ධ වෙනවා, ප්‍රත්‍යය වෙනවා. ඒක නිසා ඒ ධර්මයෝ චිත්තජ රූප ටිකට හේතු භාවයෙන් මූල භාවයෙන් ප්‍රධාන කාරණයක් වශයෙන් ඒ ශක්තියෙන් උපකාර වෙන නිසා ප්‍රත්‍යය වෙන නිසා කියනවා **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියලා. මෙන්න මේ විදියටයි මේ කාරණය අපි තේරුම් ගන්න ඕනෑ වෙන්නේ.

අපි දැන් මේක ගැන මේ විදියට කියාගෙන ගියොත් **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියලා කුසල ධර්මය අව්‍යාකෘත රූප ධර්මයන්ට ප්‍රත්‍යය වෙනවා කියලා දැන් මේ චිත්තජ රූප පහළ වෙන්නේ පළවෙනි කුසල සිතේ විතරද? නෑ. කාමාවචර පළමුවෙනි කුසල සිත පහළ වෙනකොට ඒ සිතේ තිබෙන හයියට ගැම්මට අනුකූලව කයේ පහළ වෙනවා චිත්තජ රූප. එතැනදී කියනවා **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියලා.

ඊළඟට **සෝමනස්ස සහගත ඤාණ සම්ප්‍රයුක්ත සසංඛාරික** කියන කුසල් සිත පහළ වෙනකොට එතැනත් තිබෙනවා කුසල හේතු ටිකක් ඒ සමහම පහළ වෙන තව සම්ප්‍රයුක්ත

ධර්මයෝ. එනම් සිත සහ චෛතසික. තව තිබෙනවා රූප ටිකක්. එතැනදීත් ඒ රූප උපදවන ගතිය තිබෙනවා. **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො.** එතකොට මේ විදියට මාර්ග ඵල අවබෝධ වෙන අවස්ථාව දක්වා කුසල් සිත් 21 ඔස්සේම ගිහිල්ලා **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියන කථාව හොඳට දැනගෙන යමින් ගමන් 'මේ හිතෙනුත් රූප පහළ වෙනවා' 'මේ හිතෙනුත් රූප පහළ වෙනවා' කියලා ඔය විදියට මෙනෙහි කරගෙන මෙනෙහි කරගෙන යන්න ඕන. එතකොට මෙතැනදී චිත්තජ රූප ඇතිවෙන විදිය තමයි මේ කියන්නේ. දැන් එතකොට ක්‍රම දෙකක් කිව්වා.

පළවෙනි එක තමයි **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** – **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියලා තව පේළියක් තව වීථි විග්‍රහයක් කිව්වා. දැන් අපි තව එහෙකට යමු.

3) **කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** = කුසල ධර්මයෝ කුසල ධර්මයටයි අබ්‍යාකත ධර්මයටයි දෙකටම හේතු ගුණ ශක්තියෙන් ප්‍රත්‍යය වෙනවා කියන එකයි මේ කියන්නේ.

මේවා සත්වයෝ නොවෙයි. ඒවා පුද්ගලයෝ නොවෙයි. ඒවා එකින් එකට අපි හිතුවත් නැතත් ඒ චිත්ත නියාමය ධර්ම නියාමය ගැටිලා ඒකෙ එකිනෙකට පහළ වෙනවා. අව්ව පැව්වහම ගස් කොළං හැදෙනවා ඒවගේම මල් පිපෙනවා. මේ මල් පිපෙන්න දෙවිවරු උදව් කරන්නේ නෑ. බ්‍රහ්මයෝ ඇවිල්ලා මල් පුප්පවන්නේ නෑ. ඒවගේම මිනිස්සු ගිහිල්ලා මොකක්වත් ශක්තියක් දාන්නේ නෑ. ඒවා ස්වභාව ධර්මයට අනුයාතව ඉර පායනකොට රූප වල තිබෙන ස්වභාවයන් ඉදිරිපත් වෙනවා. ක්‍රියාත්මක වෙනවා. කවුරුවත් මෙහෙය වන්න ඕන වෙන්නේ නෑ. ඒක නිසා මල සත්වයෙකුත් නොවෙයි පුද්ගලයෙකුත් නොවෙයි ආත්මයකුත් නොවෙයි ජීවියකුත් නොවෙයි. ගහත් සත්වයෙකුත් නොවෙයි පුද්ගලයෙකුත් නොවෙයි ආත්මයකුත් නොවෙයි ජීවියකුත් නොවෙයි. ඒවගේම මේ අව්‍යාකෘත ධර්ම ධර්ම ස්වභාවයන් පමණයි.

මේවා විස්තර කරලා කියලා දෙනවා මෙන්න මේ විදියට. අපි හේතු හයක් කිව්වා. පටලවා ගන්න හොඳ නෑ. **'ලෝභ හේතුව' 'ද්වේශ හේතුව' 'මෝහ හේතුව'** කියලා. **'අලෝභ හේතුව' 'අමෝහ හේතුව' 'අදෝස හේතුව'** කියලා. ඒ හේතු ධර්ම හයෙන් මේ කථා කරගෙන යන්නේ හැම වෙලාවෙම **'කුසල හේතුයි'**. මේ කුසල හේතු 3, **සම්පයුත්තකානං ඛන්ධානං -** ඒ කියන්නේ ධර්මතා තුනත් එක්ක එකට මිශ්‍ර වී හට ගන්නා වූ අනිත් චිත්ත **චෛතසික ධර්මයන්ටත්** ඊළඟට **චිත්ත සමුට්ඨානික රූපයන්ටත්** දෙගොල්ලොන්ටම එක වෙලාවේම ප්‍රත්‍යය වීමේ හැකියාවක් තිබෙනවා. ඒක හරියට කියනවා නම් අපි හිතමු අම්මයි තාත්තයි ඉන්නවා ගෙදර. එතකොට ඒ ගෙදර ඉන්නවා වැඩකාර ළමයෙක්. ඒ ළමයත් එකක් ඒ ගෙදර ඉන්න පුංචි දරුවෙක් යනවා සෙල්ලම් කරන්න. අපි හිතමු පිට්ටනියකට යනවා කියලා. පිට්ටනියට ගිහිල්ලා සෙල්ලම් කරනවා. ටික වෙලාවක් යනවා. අම්ම ගිහිල්ලා ළමයින්ට කථා කරනවා ගෙදරට එන්න කියලා. හැබැයි එතැන ඉන්නවා පවුලට සම්බන්ධ පුතා වෙන ළමයෙක් සහ තවත් කෙනෙක් ඉන්නවා පවුලට

සම්බන්ධ නෑ නමුත් ඒ පවුල නිසා ඉන්නවා සේවක ළමයා. එතකොට ඒ අම්මා ගිහිල්ලා එක වෙලාවේම කථා කරනවා 'ළමයි ගෙදර එන්න' කියලා. එහෙම කථා කරනකොට සේවකයත් එනවා පුතත් එනවා. ඒ අම්මගේ සද්දය අම්මගේ අඬ ගැසීම අම්මාගේ කථා කිරීම එක වේලාවේ ඒ දෙන්නටම ලබා දෙනවා. ඒ ශබ්දය ඒ දෙදෙනාටම ලබා දෙන්නේ වාර දෙකක නොවෙයි, එක මොහොතේ එක අවස්ථාවේ. එකම මොහොතක බල පෑමක් කරනවා. පුතාටත් අඬ ගහනවා, සේවකයටත් අඬ ගහනවා. පුතා හිතා ගන්නවා ඒ වෙලාවේදී අම්මා අඬ ගහනවා කියලා. සේවකයා හිතා ගන්නවා ස්වාමිදුව අඬ ගහනවා කියලා. ඒ දෙකම සිද්ධ වෙන්නේ එකම වේලාවේ. ඒ වගේ මේ **කුසල හේතු** දෙකක් හෝ තුනක් පහළ වෙනකොට **චිත්ත චෛතසික සම්ප්‍රයුක්ත ධර්මයන්ටත්** ඒ හා සමග උපදින්නා වූ **සමුට්ඨානික රූප** ධර්මයන්ටත් හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන ආකාරය තමයි මේ වෙලාවේදී මේ විදියට කියලා දෙන්නේ.

දැන් මේක විස්තර කරලා කථා කරනකොට අර කුසල් සිත් 21 කටම ගලපාගෙන 21 වතාවක් ඔහොම ඔහොම කියාගෙන කියාගෙන යනකොට තමයි මේක හොඳට තේරෙන්නේ. **කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියලා. ඇයි මේ විදියට පේළි ගස්සලා තිබෙන්නේ? මෙහිදී කුසලය කුසලයට හේතු වෙන විදිය කියලා දෙනවා. කුසලය අව්‍යාකෘතයට හේතුවෙන විදිය කියලා දෙනවා. කුසලය කුසලයටත් අව්‍යාකෘතයටත් දෙතැනටම ප්‍රත්‍යය වෙන විදිය කියලා දෙනවා. මෙහෙම කියලා දෙනකොට මේ හැම තැනම තිබෙන්නා වූ වෙනස් කම් අපේ හිතට ඇඳී යනවා වැටහී යනවා තේරුම් ගන්න පුළුවන් වෙනවා. පටලැවිල්ල නැතිවෙනවා. ධර්මය කුසල පේළියේ හොඳට වැඩ කරනවා. කුසල අව්‍යාකෘතයේ හොඳට වැඩ කරනවා. කුසල සහ අව්‍යාකෘත දෙකේ මිශ්‍රව යනතාලේ අපිට හොඳට පේනවා, දැනෙනවා. මේ ධර්ම අවබෝධය මේ ධර්මයන්ගේ තිබෙන ක්‍රියා කාරී ස්වභාවය හිතට මනෝමය ධර්මයක් හැටියට ධම්මාරම්මණයක් හැටියට පින්තූර ගතවෙන්න ධම්මාරම්මණයක් හැටියට අපිට අහුවෙන්න මේක වෙන වෙනම කියන්න ඕනෑ. වෙන වෙනම ළස්සනට විස්තර කරන්න ඕනෑ. එහෙම විස්තර කරනකොට තේරෙනවා මේවා ධර්ම ශක්තීන් පමණයි. මේවා කුසල වශයෙන් අව්‍යාකෘත වශයෙන් ක්‍රියාත්මක වෙන ධර්ම ශක්ති පමණයි. මෙතැන සත්ව ඇඳියක් පුද්ගල ඇඳියක් පුද්ගල එක්කාසුවක් නෑ. මෙන්න මේ වෙනස් වෙවී වෙනස් වෙවී මොහොතෙන් මොහොත මේ ධර්ම මතුවෙනවා. තව එහෙකට බලපෑමක් කරනවා. ඒ ධර්ම නැතිවෙලා යනවා, නැවතත් තව එකක් මතුවෙනවා තව එහෙකට බලපෑමක් කරනවා, නැතිවෙලා යනවා. ආන්න ඒ ධර්ම ස්වභාවය හොඳට තේරුම් ගන්න පුළුවන් වෙනවා මේ විදියට බැලීම නිසා.

මම අද දවසේදී මේ පින්වතුන්ට කියලා දුන්නේ ඔය වීථි 7 න් වීථි 3යි. මම කැමතියි දැන ගන්න අපේ පින්වතුන්ට මේ කියාපු කථාව මේ කරලා දීපු විස්තරය මේ කියලා දීපු ධර්ම විග්‍රහය හිතට ගන්න පුළුවන් උනාද? තේරුම් ගියාද? මේ අනුසාරයෙන් ඉස්සරහට යන්න පුළුවන්ද? මේක වැටහෙනවද? කියලා. දැන් තමයි ටිකක් වැඩිපුර හිත යොදන්න මෙහෙයවන්න හිතන්න අවශ්‍ය වෙන්නේ. එක කසායක බෙහෙත් වශයෙන් තිබෙන්නා වූ මුල් කොළ දළු පොතු ඇට රිකිලි සෑම දෙයක්ම වතුරේ මිශ්‍රවෙලා එක එක එකට බලපෑම් කරනවා වගේ මේ ධර්ම ගොනුවක ධර්ම රංචුවක තිබෙන්නා වූ එකිනෙකට

වෙනස් වූ ක්‍රියා ධර්ම රාශියක් බුදුරජාණන්වහන්සේ විසතුරු නුවණකින් අවබෝධ කරගෙන දේශනා කළා. ඒ දේශනාව උන්වහන්සේට නම් සවයම්භූඥාණයෙන් හොඳට අවබෝධ උනා, දේශනා කළා. ඒ අවබෝධ වෙච්ච ධර්මය සැරියුත් මහරහතන් වහන්සේ බුදුරජාණන්වහන්සේගේ ධර්මසේනාධිපතීන් වහන්සේ උන්වහසේගේ නුවණ යොදා අපිට ගැලපෙන ආකාරයට විස්තර විභාග කරලා තිබෙනවා. ඒවාගේම මේ කියන කථාව හැම එක්කෙනාටම තේරෙන්නේ නෑ. ඒකත් අපි තේරුම් ගන්න ඕනෑ. අපි කෙනෙක් පහත් කරන්න හොඳ නෑ. ඒවාගේම හැම එක්කෙනාටම මේ විග්‍රහය හසුකරගන්න ගලපාගන්න තේරුම් ගන්න බෑ කියන එකත් අපි තේරුම් ගන්න ඕනෑ. එතකොට මේක ගැලපෙන්නේ එක සමාන සිත් පරාසයක් තිබෙන්නා වූ අයවලුන්ට පමණයි. අපි විස්වාස කරනවා මේ පින්වතුන්ට ඒක ගැලපී යනවා කියලා. ඉතින් ඒක නිසා මේ පින්වතුන්ගෙන් ඇහුවට කමක් නෑ. අපේ බුදුරජාණන්වහන්සේගේ ධර්ම විග්‍රහය ඔක්කෝටම එකට දෙන්නේ නෑ. ඒ හිත්වල තිබෙන්නා වූ ග්‍රහණය කරගැනීමේ තිබෙනවා එක්තරා හැකියාවක්. ග්‍රහණය කරගන්න පුළුවන් ධර්ම කොටස් තිබෙනවා. අන්න ඒ විදියට තමයි මේක දේශනා කරලා තිබෙන්නේ. ඉතින් ඒකට ගැලපෙන කොටසකට පමණයි තේරෙන්නේ. ඒ නිසා මේ පින්වත් සැම දෙනාටම මේ ධර්ම කොට්ඨාසය හොඳින් තේරුම් අරගෙන ඒවාගේම සංසාර දුකෙන් මිදිලා නිවනින් සැනසෙන්න ලබේවා කියලා අපි ආශිර්වාද කරනවා ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස මෙතැන **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස** හෙතුපච්චයෙන **පච්චයො** කියනකොට අපිට තේරෙනවා 'අලෝභ' 'අදෝස' 'අමෝහ' කියන තුන තමයි **කුසලො ධම්මො** කියලා කියන්නේ **කුසලස්ස ධම්මස්ස** කියලා කියනකොට ස්වාමීන්වහන්ස අපිට තේරෙන දෙයක් තමයි අලෝභය කියන එක නිසා අනෙකුත් හේතුත් එනවා කියලා. 'අලෝභ' 'අදෝස' 'අමෝහ' කියන තුනම ගත්තොත් එයින් එකක් ඉතිරි චෛතසික දෙකටත් හේතු ප්‍රත්‍යයයෙන් පප්‍රත්‍යය වෙනවා කියලා ගත්තොත් හරිද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - එහෙම තමයි මහත්තයා. තව පොඩි විස්තරයක් මම කළොත් හොඳයි කියලා හිතනවා මේ පිංවතුන්ගේ ධර්ම අවබෝධය සඳහා. පාලි භාෂාවේ තිබෙනවා වචන හසුරුවන විදියක්. සමහර වෙලාවට මේ පින්වතුන්ට ඇහෙනවා ඇති වචන **කුසලා ධම්මා** කියලා යනවා. එතකොට මේ වචන දෙකම කෙළවර වෙන්නේ **'ආ'** ශබ්දයෙන්. මෙහෙම හඬ නැංවෙන්නා වූ වචන තිබෙන කොට ඒකෙන් අපි තේරුම් ගන්න ඕනෑ ගොඩක් ගැන කියන එකක් කියලා. බහු වචනයක්. කුසලා කියලා කියන්නේ කුසල ධර්මයෝ කියන එකයි. හැබැයි අද කථා කරපු එකේ තිබුණේ **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො** කියලා. එතැන 'ආ' ශබ්දය නෑ. **කුසලො ධම්මො** කියන තැන ආවේ **'ඕ'** හඬ. මේ කුසල පදය විස්තර කිරීමේදී එහි අග **'ඕ'** හඬින් යනවා නම් ඒක ඒක වචනයි. ඒක නිසා මතක තබා ගන්න කුසල ධර්මයක් අනිත් චිත්ත චෛතසික ධර්මයන්ට හේතු ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා.

උදාහරණයක් හැටියට ජයන්ත මහතත්යා අහපු ඒ කාරණයත් සම්බන්ධ කරලා මෙහෙම හිතමු. අපි භාවනා කරනවා. ලංකාවේ ඉන්නා වූ කවුරු හරි එක්කෙනෙක් හිතෙන්

අරමුණු  කරගෙන සුවපත් වේවා! සුවපත් වේවා! කියලා හොඳට මෛත්‍රී වඩනවා. ඒක කුසල් සිතක්. ඒ සිතේ පහළ වෙනවා  මෙන්න මේ චෛතසික ධර්ම ටික. ඒ තමයි සර්ව චිත්ත සාධාරණ සහ ප්‍රකිර්ණක  යන අන්‍යසමාන  චෛතසික  සියල්ලම 13යි. ඒවාගේම පහළ වෙනවා  කුසල සිත්  වල පමණක් පහළ වෙන්නා වූ කුසල සාධාරණ චෛතසික 19.  ඊට පස්සේ තිබෙනවා **'ප්‍රඥා'** චෛතසික. එතකොට ඔක්කොම 33 යි. එතැනදී **විරති** පහළ වෙන්නේ නෑ. **කරුණා මුදිතා** චෛතසික දෙකත් පහළ වෙන්නේ නෑ,  වඩන්නේ **මෛත්‍රීය** නිසා. එතකොට මෙතැන පහළ  වෙනවා  චෛතසික ධර්ම 33 ක්. ඕකට **හිතත්** එක්කාසු වෙනවා. එතකොට ඔක්කොම නාම ධර්ම 34යි.  ඔය නාම ධර්ම 34 ට තමයි අර ලංකාවේ ඉන්න මනුස්සයා අරමුණු වෙන්නේ. එතකොට   ඒ ලංකාවේ   ඉන්න එක්කෙනාටත්  මේ නාම ධර්ම 34 න්  තමයි සුවපත් වේවා! සුවපත් වේවා! කියලා මෛත්‍රී අපි වඩන්නේ. මේ ධර්මතා 33  නේ තිබෙනවා **'හේතු තුනක්'**. අනිත් නාම ධර්ම 31 තුල තිබෙනවා 'සිත' සහ 'ඉතිරි චෛතසික' . ඒ **'හේතු තුන'** ගත්තහම   වාර තුනකදී විස්තර කරන්න ඕන.

දැන් මෙතන තිබෙනවා **'අලෝභ' 'අදෝස' 'අමෝහ'** කියන හේතු ධර්ම තුන. ඉස්සෙල්ලාම ගමු '**අලෝභය'. 'අලෝභය'** කියන හේතු ධර්මය අයින් කරහම තව තිබෙනවා 33ක්. සිතයි චෛතසික 32 යි. එතැනදී මේ '**අලෝභ හේතුව'** අර **'සම්ප්‍රයුක්තක චෛතසිකයන්ටයි' 'සම්ප්‍රයුක්තක සිතටයි' 'සම්ප්‍රයුක්තක හේතු දෙකටයි'** යන තුන් ගොල්ලන්ටම **හේතු ප්‍රත්‍යයෙන්** ප්‍රත්‍යය වෙනවා. එතකොට මෙතැනදී **'අලෝභය'** නමැති  කුසලො ධම්මො, කුසලස්ස ධම්මස්ස (ඒ කියන්නේ අනිත් කුසල ධර්මයන්ට හෙතුපච්චයෙන පච්චයො) **හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.**

මේක බහු වචනයෙන් කියලා තිබෙනවා **සම්පයුත්තකානං ඛන්ධානං** කියලා. **ඛන්ධානං** කියලා කියන්නේ බහු වචනයෙන්. එතකොට **'අලෝභය'** කියන්නා වූ **හේතුව** අර අනිත් **'හේතු දෙකටයි' 'හේතු නොවෙන්නා වූ චෛතසිකයන්ටයි'**  පොදුවේ **හේතු ප්‍රත්‍යයෙන්** ප්‍රත්‍යය වෙනවා.

ඊළඟට ගන්නවා **'අද්වේශය'**. **'අද්වේශය'** ගත්තහමත් **කුසලෝ ධම්මෝ** ඒ කියන්නේ **'අලෝභය' 'අමෝහය'** කියන හේතු දෙකටත්  ඉතිරි **චෛතසික ධර්මයන්ටයි 'හේතු ප්‍රත්‍යයෙන්'** ප්‍රත්‍යය වෙනවා. මේක තුන් සැරයක් කියන්න පුළුවන්. මේක පැහැදිලිව ඉදිරිපත් කරලා තිබෙන්නේ ඒක වචනයෙන් මේක පොඩියටම කඩලා තේරුම් ගැනීමට. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u>  - ස්වාමීන්වහන්ස එතැනත් කුසලස්ස ධම්මස්ස කියනකොට ඒක වචනයෙන් තමයි නේද ස්වාමීන්වහන්ස අරගෙන තිබෙන්නේ. ඒක තවත් පොඩියට කඩන්න පුළුවන්ද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - පුළුවන්

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ **කුසලා හෙතූ සම්පයුත්තකානං ඛන්ධානං හෙතුපච්චයෙන පච්චයො** කියලා. එතකොට ස්වාමීන්වහන්ස එතැන **'කුසලා හේතු'** කිව්වහම බහු වචනයෙන් **සම්පයුත්තකානං ඛන්ධානං** කියලා බහුවචනයෙනුත් කියනවා. ස්වාමීන්වහන්ස එතැනදී 'වේදනා' 'සංඥා' 'සංඛාර' 'විඤ්ඤාණ' කියන ටික ඇතුලත් වෙනවා. පළමුවෙනියට පහළ වෙන **කුසල ධම්ම** ටිකෙත් ඒ ටික ඇතුලත් නේද? ඇයි එහෙනම් වාක්‍ය දෙකකින් පැහැදිලි කළේ කියලා පොඩි ගැටලුවක් ආව ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - එතැන බහු වචනය පාවිච්චි කරනවා. **කුසලා හේතු** = **කුසල් වූ හේතු ධර්ම**, ඊට පස්සේ **සම්පයුත්තකානං ඛන්ධානං** කියලා බහු වචනයෙන් පාවිච්චි කරනවා. **සම්පයුත්ත ඛන්ධ** කියලා කියන්නේ ඒ **'හේතු ධර්මයන්ට'** ඊළඟට ඉදිරිපත් වෙන්නා වූ **'වේදනාව' 'සංඥාව' 'සංස්කාර'** වශයෙන් අනිත් චෛතසික ධර්ම සහ **'හිත'** ඔක්කෝම අරගෙන **සම්පයුක්තක ඛන්ධ** වචනයෙන් පාවිච්චි කරනවා **හෙතුපච්චයෙන පච්චයො** කියලා. එතැන තිබෙන්නේ බහු වචනයෙන්. **සම්පයුත්තකානං ඛන්ධානං** කියලා කිව්වහම බහු වචනයක්. බහු වචනයෙන් තිබෙන්නේ **වේදනා ගොඩයි, සංඥා ගොඩයි, සංඛාර ගොඩයි, විඤ්ඤාණ ගොඩයි** ඔක්කොම ටික දාල.

<u>ජයන්ත මහත්මයා</u> - හොඳමයි ස්වාමීන්වහන්ස ඔබ වහන්සේගේ කාල වේලාවත් සලකල අපිට පුළුවන් අද දවසේ සාකච්ඡාව නිමා කරන්න ස්වාමීන්වහන්ස. අප්‍රමාණ පිං ඔබ වහන්සේට අපි වෙනුවෙන් මේ කරන සේවයට. ඉතින් අපි සවනට සිසිලස වෙනුවෙන් ඔබ වහන්සේට අනන්ත අප්‍රමාණ පුණ්‍යානුමෝදනා කරනවා ස්වාමීන්වහන්ස ඔබ වහන්සේගේ බලාපොරොත්තු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා! නිර්වාණ ධාතුව පරිපූර්ණ වශයෙන් අවබෝධ වේවා! කියලා අපි වෙනුවෙන් කරන ලද ධර්ම දානය හේතු කරගෙන. ස්වාමීන්වහන්ස ඔබ වහන්සේට ඉතාමත්ම ගෞරවයෙන් යොමු වෙනවා අද දවසේ සාකච්ඡාව නිමා කරන්න. තෙරුවන් සරණයි.

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි, පින්වත් සැම දෙනාටම යහපතක් වේවා! තෙරුවන් සරණයි! අපි ආපු ධර්ම සකච්ඡා ගමන් මගේ අද ඉදිරිපත් උනේ තවත් අවස්ථාවක්. ඉතින් මේක පරෙස්සමෙන් ඉස්සරහට ගෙනියන්න ඕනෑ. මේ පින්වතුන් හොඳට හිතන්න මෙනෙහි කරන්න. පැටලුම් ඇරගෙන තේරුම් ගන්න මහන්සි ගන්න. ඒ සඳහා සැම දෙනාටම ශක්තිය ලැබේවා! මේ දහම් වැඩ සටහන ආරම්භ කරගෙන විසාල පිරිසකට දහම් දැනුම ලබා දීම සඳහා මේ වැඩ කරයුත්ත ආරම්භ කළා වූ පින්වත් ලලිත් දළුවත්ත මහත්මයාටත් ඒවගේම මෙහෙය වීම් කටයුතු කරන්නා වූ පින්වත් ජයන්ත මහත්මයාත් ප්‍රශ්න අහන්නා වූ පින්වත් මහත්ම මහත්මීන් සැමදෙනාටමත් ඒ පවුල්වල සැම දෙනාටමත් සැනසිල්ලක් යහපතක් වේවා!

ඒවගේම සියලු දෙනාම ප්‍රාර්ථනා කරන පරිදි අර්ථය කුමක්ද කියා තේරුම් ගන්න ලැබේවා! ධර්මය කුමක්ද කියා තේරුම් ගන්න ලැබේවා! නිරුක්තිය වචනය පදය කුමක්ද කියා තේරුම් ගන්න ලැබේවා! ඒවාගේම මේ ධර්මතා තුන පිළිබඳව දැනුම පටිභානය හැටියට තේරුම් ගන්න ලැබේවා! ඒවාගේම පිළිසිඹියා පත් ඥාන ධර්මයන් මුහුකරවාගෙන මතුකරගෙන වටහාගෙන ඒවාගේම ඥාන ධර්මයන් නිවැරදිව යහපත්ව

තේරුම් අරගෙන කිසිම තැනක මුලා නොවී කිසිම දෙකට දෘෂ්ඨිගත නොවී ඒවාගේම නියම ධර්මයේ පිහිටා සම්මා දිට්ඨිය වඩාගෙන සැමදෙනාටම උතුම් අමාමහ නිවනින් සැනසෙන්න ලැබේවා! නිවන් පිණිස මේ කුසල් මේ පින් හේතු වාසනා වේවා! කියලා මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. සෙත් පතනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි